සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

7 ශ්‍රේණිය | **කතෝලික ධර්මය** | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

**I කොටස**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1- 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. නාතාන්, එළියා, එලීෂා යන දිවැසිවරුන් හඳුන්වන්නේ,

(1) ප්‍රධාන දිවැසිවරු ලෙස ය. (2) දේශක දිවැසිවරු ලෙස ය.
(3) සුළු දිවැසිවරු ලෙස ය. (4) ලේඛක දිවැසිවරු ලෙස ය.

02. "ආබ්‍රම්" යන්නෙහි අර්ථය වන්නේ,

(1) විශ්වාසයේ පියා ය. (2) ඉශ්‍රායලයේ පියා ය.
(3) උතුම් පියා ය. (4) ජාතීන්ගේ පියා ය.

03. ආබ්‍රහම් ඊසාක් රැගෙන දවන යාග පූජාවක් සඳහා ගියේ කොහේද?

(1) මොරියා දේශයට ය. (2) බෙතෙල් ප්‍රදේශයට ය.
(3) තාගෝර් කන්දට ය. (4) ඔලීව කන්දට ය.

04. "මා අනුව එන්න" යනුවෙන් ජේසුස් වහන්සේ කැඳවනු ලැබුවේ කවුරුන්ද?

(1) සුවිශේෂකවරුන් ය. (2) දිවැසිවරුන්ව ය.
(3) වීර නායකයින්ව ය. (4) ප්‍රථම ශ්‍රාවකයින්ව ය.

05. රාජගුරුප්‍රසාදීන් වහන්සේලා යටතේ රදගුරු පදවිය තුළ සේවය කරන පූජාප්‍රසාදීන් වහන්සේලා හඳුන්වන්නේ,

(1) පදවි පූජකවරු ලෙස ය. (2) තේවාචාරීන්වරු ලෙස ය.
(3) පැවිදි පූජක ලෙස ය. (4) මීසම් පූජකවරු ලෙස ය.

06. බොරු සාක්ෂි කීමට අපව යොමුකරන්නේ කවුරුන්ද?

(1) යහපත් මිතුරන් ය. (2) අසල්වාසීන් ය. (3) සිතුවිලි ය. (4) සාතන් ය.

07. ශු. දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා විසින් ජපමාලයට හඳුන්වා දුන් නව අභිරහස් වන්නේ,

(1) දොම්නස් අභිරහස් ය. (2) මෝක්ෂ අභිරහස් ය.
(3) ආලෝකයේ අභිරහස් ය. (4) සොම්නස් අභිරහස් ය.

08. කිතුනුවන්ට ආගම ඇදහීමේ නිදහස දුන් අධිරාජ්‍යයා වන්නේ,

(1) රෝම අධිරාජ්‍යයා ය. (2) කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයා ය.

(3) හෙරෝද් අග්‍රිපා රජ ය. (4) කොන්ස්තන්තිනෝපල් අධිරාජ්‍යයා ය.

09. පාද නමස්කාරයේ දී ජේසුස් වහන්සේගේ වස්ත්‍ර කඩා දමනු ලබන්නේ කුමන ස්ථානයේ ද?

(1) 10 වන ස්ථානයේ ය. (2) 8 වන ස්ථානයේ ය.

(3) 9 වන ස්ථානයේ ය. (4) 11 වන ස්ථානයේ ය.

10. ජේසුස් වහන්සේ ශු. මර්ගරීතා මරියතුමිය මඟින් ආරම්භ කළ භක්ති අභ්‍යාසය වන්නේ,

(1) පාද නමස්කාරය වේ. (2) ශු. පැය වේ.

(3) ශු. ජපමාලය වේ. (4) යාම යැදුම් වේ. (ලකුණු 2 x 10 = 20)

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුර හරි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

11. ප්‍රසාද ස්නාපනයේ අනිවාර්ය හා අත්‍යවශ්‍ය පිළිවෙත වන්නේ හිසමත ජලය වත් කිරීමයි. (..........)

12. පැවිදි පූජකවරු ලබා ගන්නේ පොරොන්දු ය. (..........)

13. මනාලයා හා මනාලිය විවාහයේ පාර්ශව දෙකවෙයි. (..........)

14. ශු. බයිබලයට අනුව බොරු කීම බරපතල පාපයකි. (..........)

15. ජේසුස් වහන්සේ රේගු පොළේ දී කැඳවනු ලැබුවේ ශු. මතෙව් තුමන්ව ය. (..........)

(ලකුණු 2 x 05 = 10)

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

16. ................................................................................. දිවැසිවරයෙකු වීමට පෙර අත්තික්කා වගා කළ ගොවියෙකි.

17. බබදියා, ජෝනා, මීකා යන දිවැසිවරුන් හඳුන්වන්නේ ....................................................... දිවැසිවරු ලෙස ය.

18. "ඔහු රතු පාටය. ඔහුගේ ඇඟ පුරාම ලෝම වැස්මක් මෙන් විය." මෙසේ සඳහන් කරන්නේ ..................................................... පිළිබඳව ය.

19. මුල් කිතුනු සභාවේ දොළොස්වන අපෝස්තුළුවරයා ලෙස ගණන් ගනු ලබන්නේ ............................................. මුනිතුමා ය.

20. පොදු පූජකවරය තුළ සේවය කළ හැකි අවස්ථාවක් වන්නේ .......................................................................... යි.

( ශු. මතියස් / ප්‍රධාන / ආමෝස් / සුළු / ඒසව් / ධර්මදූත ළමා සමාජය )

(ලකුණු 2 x 5 = 10)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) නියං කාලයේ දී එලියා දිවැසිවරයාට කපුටෝ ගෙනවිත් දුන්නේ මොනවාද?

(2) දෙවියන් වහන්සේගේ නියමය අනුව ආබ්‍රහම් තුමාට පරිත්‍යාග කිරීමට සිදු වූ දේවල් 02 ක් ලියන්න.

(3) ජේසුස් වහන්සේ මෙලොවින් සමුගැනීමට පෙර තම ශ්‍රාවකයන්ට දුන් නියෝග දෙකක් ලියන්න.

(4) පදවි පූජකවරු ලබා ගන්නා පොරොන්දු දෙක මොනවාද?

(5) පොදු පූජකවරය තුළ අපට ලැබෙන වගකීම් දෙකක් ලියන්න.

(6) ආශිර්වාදකාර බන්ධනය නම් ගිවිසුමෙහි සාක්ෂිකරුවන් වන්නේ කවුරුන්ද?

(7) දසපනත බෙදෙන ප්‍රධාන කොටස් දෙක මොනවාද?

(8) ශු. පැය නම් භක්ති අභ්‍යාසය සිදු කළයුතු අවස්ථා දෙකක් ලියන්න.

(9) දෙව් මැදුරේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කර තිබෙන අවස්ථාවේදී අප හැසිරිය යුතු ආකාර දෙකක් ලියන්න.

(10) කිතුනු ඔබ වන්දනා ගමන් යන ස්ථාන දෙකක් ලියන්න. (ල. 2x10=20)

02. (1) ආබ්‍රහම් තුමාගේ කැඳවීමේ අංග දෙක මොනවාද? (ල. 02)

(2) ඒසව් සමග ජාකොබ් සමගි වීමෙන් ලබාගත හැකි ආදර්ශ තුනක් ලියන්න. (ල. 03)

(3) ප්‍රසාද ස්නාපනය මගින් ළමා ඔබට ලැබී ඇති කැඳවීමට ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න. (ල. 05)

03. (1) පූජකවරය නමැති සක්‍රමේන්තුව ස්ථාපිත කරනු ලබන්නේ කවදාද? කුමන අවස්ථාවේද? (ල. 02)

(2) පූජකවරයෙහි ධූර තුන මොනවාද? (ල. 03)

(3) පූජාප්‍රසාදීන් වහන්සේලා වෙනුවෙන් ඔබ විසින් ඉටුකළ යුතු යුතුකම් මොනවාද? කරුණු 05 ක් ලියන්න. (ල. 05)

04. (1) දස පනතේ හත්වන පනතට අනුව සොරකම සිදුවන ආකාර දෙකක් ලියන්න. (ල. 02)

(2) සාධාරණව වස්තුව ලබාගත හැකි මාර්ග තුනක් ලියන්න. (ල. 03)

(3) සත්‍යගරුක සමාජයක් ගොඩනැගීමට කිතුනු ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න. (ල. 05)

05. (1) ජපමාලය උච්චාරණය කිරීමේදී විශේෂයෙන් අප උච්චාරණය කරන යාච්ඤා දෙකක් ලියන්න. (ල. 02)

(2) ජපමාලයේ දී ගැලවීමේ අභිරහස් තුළින් මෙනෙහි කරන ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ කරුණු 03 ක් ලියන්න. (ල. 03)

(3) ජපමාලයෙන් අනතුරුව උච්චාරණය කරන ප්‍රාර්ථනාවල් පහක් ලියන්න. (ල. 05)

06. (1) "නුවානය" සඳහා ලතින් භාෂාවේ සඳහන් වචනය කුමක්ද? එහි අර්ථය මොනවාද? (ල. 02)

(2) යාම යැදුම යදින අවස්ථා අනුව යාම යැදුම් වර්ග තුනක් ලියන්න. (ල. 03)

(3) දේවස්ථාන මංගල්‍ය පැවැත්වීමට හේතු පහක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (2) 02. (3) 03. (1) 04. (4) 05. (1) 06. (4) 07. (3) 08. (2) 09. (1) 10. (2)

11. ✓ 12. x 13. ✓ 14. ✓ 15. ✓ 16. ආමෝස් 17. සුළු 18. ඒසව්

19. ශු. මතියස් තුමා 20. ධර්මදූත ළමා සමාජය

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) මස් හා රොටී
(2) තමාගේ මව්බිම ♦ තමාගේ නෑදෑයන් ♦ පියාගේ ගෘහය
(3) සකල ජාතීන් ශ්‍රාවකයන් කරන්න. ♦ පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බෞතිස්ම ස්නාපනය කරන්න. ♦ මා ඔබට අණ කල සියල්ල රක්‍ෂා කරන්න ඔවුන්ට උගන්වන්න.
(4) කීකරුකම ♦ පූජක
(5) එඬේරික ♦ පූජක ♦ දිවැසිවර
(6) පූජාප්‍රසාදිතුමා ♦ රැස්ව සිටින නෑදෑ හිතමිතුරෝ
(7) I කොටස - දෙවියන් වහන්සේට වන්දනා කිරීම. II කොටස - අසල්වැසියට ප්‍රේම කිරීම.
(8) මහ බ්‍රහස්පතින්දා ♦ සෑම සතියකම බ්‍රහස්පතින්දා හෝ සිකුරාදා ♦ දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍ය පවත්වන විට ♦ ධර්ම විවේක දිනවල ♦ විශේෂ අවශ්‍යතා වෙනුවෙන්.
(9) නිශ්ශබ්දතාව සුරැකීම. ♦ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට දණ නමා නමස්කාර කිරීම. ♦ උන්වහන්සේ අභියස යාච්ඤාවේ හා භාවනාවේ නිරතවීම. ♦ දේවස්ථානය තුළ සංවර ලෙස ගමන් කිරීම.
(10) මරුද මඩු දේවමාතා සිද්ධස්ථානය ♦ තලවිල සාන්ත ආනා සිද්ධස්ථානය ♦ තේවත්ත ලංකා අප ස්වාමිදූවගේ බැසිලිකාව ♦ මාතර ජයලත් අප ස්වාමිදූවගේ සිද්ධස්ථානය (ල. 2x10=20)

02. (1) පරිත්‍යාගය ♦ අභියෝග (ල. 02)
(2) වරදක් කළ කල්හි එම වරද පිළිගෙන සමාව ලබාගැනීම. ♦ තමාට වැරදි කළ අයට සමාව දීම. ♦ වචනයෙන් සමාව දී ක්‍රියාවෙන් ද එය ඔප්පු කිරීම. ♦ සහෝදරයා සමඟ සමගියෙන් ජීවත් වීම. (ල. 03)
(3) ශු. සභාවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වීම. ♦ තම ජීවිතය තුළින් ක්‍රිස්තුන් වහන්සේ හඳුන්වා දීම. ♦ අනුන් ඉදිරියේ කිතුනු ඇදහිල්ලට සාක්ෂි දැරීම. ♦ දසපනතට අනුව ජීවත් වීම. ♦ අන් අයට දුන් පොරොන්දු ඉටු කිරීම. (24 පිටුව) (ල. 05)

03. (1) මහ බ්‍රහස්පතින්දා ♦ අන්තිම රාත්‍රී භෝජනයේදී (ල. 02)
(2) රාජගුරු ♦ පූජක ♦ තේවාචාරී (ල. 03)
(3) ඔවුන් උදෙසා යාච්ඤා කිරීම. ♦ ජනවන්දනා කටයුතුවලට සහය වීම. ♦ ඥානගෝපාලයන් නඩත්තුවට ආධාර ලබාදීම. ♦ දේව රාජ්‍ය පතළ කිරීමට සහය වීම. ♦ ඔවුන් හා එක්ව දයා සේවාවල නිරතවීම... යනාදියට ලකුණු දෙන්න. (ල. 05)

04. (1) ප්‍රයෝග ♦ වංචනික ක්‍රියා ♦ අල්ලස් ගැනීම ♦ සේවකයාට සාධාරණ වැටුපක් නොගෙවීම ♦ භාණ්ඩවල ගුණාත්මක බව අඩු කිරීම. (ල. 02)
(2) අවංකව වැඩ කිරීමෙන් ♦ කැපවීමෙන් හා වෙහෙස මහන්සියෙන් ♦ මිලට ගැනීමෙන් ♦ හුවමාරු කර ගැනීමෙන් ♦ තෑගි වශයෙන් ♦ උරුම වශයෙන් (ල. 03)
(3) සැමවිටම ඇත්ත කතා කිරීම. ♦ අසත්‍ය තොරතුරු ප්‍රචාරය නොකිරීම. ♦ නොදන්නා දේවල් හා පුද්ගලයන් ගැන කතා නොකිරීම. ♦ අවංකව කටයුතු කිරීම. ♦ පුද්ගලයන් පිළිබඳ ගතු කේලම් නොකීම හා චරිත ඝාතන නොකිරීම. (ල. 05)

05. (1) සකලගුණ සම්පන්න යැදුම ♦ මංගල්‍ය ආරාධනාව ♦ අහෝ මාගේ දෙවිඳුනි යැදුම (ල. 02)
(2) ක්‍රිස්තුන් වහන්සේගේ උපත ♦ දුක්ප්‍රාප්තිය ♦ මරණය ♦ උත්ථානය ♦ ස්වර්ගාරෝහණය (ල. 03)
(3) ජේසුස් වහන්සේගේ දිව්‍ය හෘදයේ ප්‍රාර්ථනාව ♦ දේව මාතා ප්‍රාර්ථනාව ♦ සාන්ත අන්තෝනි මුනිඳුන්ගේ ප්‍රාර්ථනාව ♦ සාන්ත සෙබස්තියන් මුනිඳු ප්‍රාර්ථනාව ♦ සාන්ත ජූඩ් මුනිඳු ප්‍රාර්ථනාව (ල. 05)

06. (1) නෝවෙම් - නවය (ල. 02)
(2) උදා යාම යැඳුම ♦ දිවා යාම යැඳුම ♦ සැදෑ යාම යැඳුම ♦ රාත්‍රී යාම යැඳුම (ල. 03)
(3) අධ්‍යාත්මික ජීවිතයෙහි ප්‍රබෝධයක් ඇති කිරීම. ♦ දේව වචනයෙන් ජීවිතය පෝෂණය කර ගැනීම. ♦ දේවස්ථානය කැපකර ඇති ශුද්ධවන්තයාගේ මැදිහත්කම තුළ ලද දීමනාවන්ට තුති පිදීම. ♦ එතුමන්ලාගේ ජීවිත ආදර්ශය මෙනෙහි කර ජීවිත හැඩගස්වා ගෙන අන් අයට ආදර්ශමත් කිතුනුවෙකු වීම. ♦ ඉදිරි වර්ෂය තුල මීසම්වාසී ජනතාව එතුමාණන්ගේ මැදිහත් පිහිටට භාර කිරීම (ල. 05)